**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ආයුර්වේද වෛද්‍ය සභාව

**කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තාක්ෂණ නොවන ( MA 1-2 ) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම - (දෙමළ මාධ්‍ය)**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහරගම, නාවින්න පිහිටි ආයුර්වේද වෛද්‍ය සභාවේ ඉහත තනතුර සඳහා යෝග්‍ය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර ස්ථිරසේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරකි.

බඳවා ගැනීමේ සුදුසුකම් :

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01 ( එකයි ) - මෙම තනතුර දෙමළ භාෂාවෙන් කටයුතු කිරීම සඳහා බඳවා ගනු ලැබේ. එම තනතුර සඳහා අයදුම්කරනු ලබන තැනැත්තන් දෙමළ මාධ්‍යයෙන් පහත අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සිංහල භාෂාව පිළිබඳ දැනුම ද විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

| | |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී **සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථ** සහිතව එකවර විෂයන් හයකින් සමත්ව තිබීම;<br>*හා*<br>ii. අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර **විෂයයන් තුනක් සමත්ව තිබීම;**<br>iii. රජය පිළිගත් ආයතනයක මාස හයකට (06) නොඅඩු කාර්යාල මෘදුකාංග (Microsoft Office ) පිළිබඳ පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ. (සහතික මගින් සනාථ කළ යුතු ය.) |
| **වයස** | **-** අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතු ය. |
| **වැටුප් පරිමාණය** | **-** ක.සේ.චක්‍රලේඛ අංක 01/2025 අනුව MA 1-2 වැටුප් කේතය හිමි තනතුරකි.<br>වැටුප් පරිමාණය රු. **46,220 - 10x540 – 7x630 – 12x1,080 – 12x1,280 – රු. 84,350** වේ. (රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හා දිරි දීමනාව අතිරේකව ඇතුළත් වේ)<br>**2026.01.01 දිනට ආරම්භක වැටුප රු.43,312/- කි.** |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | - සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, වසර තුනක 03 ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ. |
| **පත්වීම් බලධාරියා** | - සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව. |
| **අයැදුම්කරන පිළිවෙල** | **-** සියළුම ජීව දත්ත හා පළපුරුද්ද ඇතුළත් කොට මේ සමග අමුණා ඇති ආකෘතිය පරිදි තමා විසින්ම අයදුම්පත පිළියෙල කළ යුතු ය. ඉහතින් සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට පමණක් අදාළ අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ද අයදුම්පත හා අමුණා එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහල වම්පස කෙලවරෙහි **"කළමනාකරණ සහකාර III ශ්‍රේණියට බඳවා ගැනීම - ආයුර්වේද වෛද්‍ය සභාව"** ලෙස සඳහන් කොට **2026 ජූලි මස 03 දිනට හෝ ඊට පෙර "සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. |

ලබා දී ඇති උපදෙස් අනුව යොමු නොකරනු ලබන අයැදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර බඳවා ගැනීම පිළිබඳ අවසාන තීරණය ආයුර්වේද වෛද්‍ය සභාව සතු ය.

ජේ.එම්.ජී.එන්. දීප්ති සුමනසේන,<br>
සභාපති,<br>
ආයුර්වේද වෛද්‍ය සභාව,<br>
ආයුර්වේද කොමසාරිස් ජනරාල්.

2026 ජුනි මස 02 දින ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී ය.